
# The Great Renunciation
# මහා අභිනිෂ්ක්‍රමණය



In the silence of that moonlit night (it was the full-moon day of July, (Esala) such thoughts as these arose in him:

" Youth, the prime of life, ends in old age and man's senses fail him at a time when they are most needed. The hale and hearty lose their vigour and health when disease suddenly creeps in. Finally death comes, sudden perhaps and unexpected, and puts an end to this brief span of life. Surely there must be an escape from this unsatisfactoriness, from ageing and death."

Thus the great intoxication of youth (yobbana-mada), of health (ârogya-mada), and of life (jivita-mada) left him. Having seen the vanity and the danger of the three intoxications, he was overcome by a powerful urge to seek and win the Deathless, to strive for deliverance from old age, illness, misery, and death not only for himself but for all beings (including his wife and child) that suffer.n7 It was his deep compassion that led him to the quest ending in enlightenment, in Buddhahood.

It was compassion that now moved his heart towards the great renunciation and opened for him the doors of the golden cage of his home life. It was compassion that made his determination unshakeable even by the last parting glance at his beloved wife asleep with the baby in her arms.

Thus at the age of twenty-nine, in the flower of youthful manhood, on the day his beautiful Yasodharâ had given birth to his only son, Râhula, Prince Siddhârtha Gotama, discarding and disdaining the enchantment of the royal life, scorning and spurning joys that most young men yearn for, tore himself away, renouncing wife and child and a crown that held the promise of power and glory.

He cut off his long locks with his sword, doffed his royal robes, and putting on a hermit's robe retreated into forest solitude to seek a solution to those problems of life that had so deeply stirred his mind. He sought an answer to the riddle of life, seeking not a palliative, but a true way out of suffering,to perfect enlightenment and Nibbâna. His quest for the supreme security from bondage, Nibbâna (Nirvâna), had begun. This was the great renunciation, the greatest adventure known to humanity.

එය ඇසළ මාසයේ පුර පසළොස්වක දිනයයි. සඳ පහනින් නැහැවෙන ඒ රැයේ සිදුහත් කුමරුට තමා දැක තිබූ සතර පෙර නිමිති සිහියට එත්ම මෙසේ සිතින.

" තාරුණ්‍ය නම් ජීවිතයේ සුන්දරතම කාලය අවසන් වන්නේ දුබලවූ මහළු වයසට යාමෙනි. එවිට ඉන්ද්‍රියයන් ගෙන් කිසි පිහිටක් නොලැබේ. මක්නිසාද ඒ සියල්ල දුර්වලව ඇති බැවිනි. නිරෝගීව තිබුණු ශරීරය හදිසියේම ලෙඩ දුක් වැළඳීමෙන් දුබල වී ශක්තියෙන් පිරිහී යයි. අවසානයේ සමහර විට හදිසියේම නොසිතූ ලෙස මරණය පැමිණ ඒ කෙටි ජීවිතය අවසන් කර දමයි. සතුටුවන්නට යයි දෙයක් ජීවිතයේ සැබැවින්ම ඇද්ද ? "

තරුණවියේ දී කෙනෙකු මත්කර තබන කාරණා තුනක් වෙයි. තරුණකම, නිරෝගිකම සහ යොවුන් ජීවිතයයි. එහෙත් මේ සියල්ල නිෂ්ඵල මායාවක් වන්නේ ලෙඩ දුක්, මහළු විය, සහ මරණය විසින් මේ මදයන් විනාශකරනු ලබන බැවිනි. රෝගීබව, වයස් ගතවීම හා මරණය ජය ගැනීමට ක්‍රමයක් සෙවිය යුතුයයි කුමරුට සිතිණ.

මෙම සෙවීම තමා සඳහාම නොවේ. තමාට, තම බිරිඳට දරුවාට පමණක් නොව මුළුමහත් ලෝකයාටමය. මේ අවස්ථාවේ දී කුමරුන්ගේ සිත ලෝක සත්වයා කෙරෙහි අප්‍රමාණ අනුකම්පාවෙන් පිරිණ. පිළියම් සොයන්නට රජ සැපත් ආදී සියල්ල හැරදමා යායුතුයයි ඔහුට සිතිණ.

එසේ වයස විසි නවයේ සුන්දර තරුණවියේදීම සිදුහත් කුමරු යසෝධරා නම් සිය සුරූපී බිරිඳ පුතෙකු බිහිකළ දිනයේම රාත්‍රි බිරිඳත් දරුවාත් දෙස සෙනෙහසින් බලා, රජ සැප හා රාජකීය ජීවිතය හැරපියා මාළිගයෙන් නික්මුණේය.

නේරංජනා නදී තීරයට පැමිණ එහි ඉවුරේදී සිදුහත් කුමරු රාජාභරණ උනා කඩුවගෙන සියතින්ම කෙස්වැටිය කපා දමා සාමාන්‍ය රෙදිකඩක් පොරවාගෙන තාපසයෙක් ලෙසින් ඉදිරියට පිය නැගීය.

මෙම අසිරිමත් ගමන මහා අභිනිෂ්ක්‍රමණය ලෙසින් ලෝකයා හඳුන්වන්නේ මෙතරම් සැප සම්පත් ඉවතදමා සත්‍යය සොයා ගිය තවත් කෙනෙකු මේ මානව ඉතිහාසයේ මෙතෙක් හමුවී නැති බැවිනි.


Duke's Court Travel

DUKE'S COURT TRAVEL Travel Management

Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £260 + Taxes + 10,000 Air Miles |
| QATAR AIRWAYS القطرية | Qatar Airways | fr £289 + Taxes |
| KUWAIT AIRWAYS | Kuwait Airways | fr £219 + Taxes |
| Emirates | Emirates | fr £430 + Taxes |
| ETIHAD | Etihad Airways | fr £245 + Taxes |
| OMAN AIR | Oman Air | fr £163 + Taxes |

Note: All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

ATOL 3045 PROTECTED AITO THE ASSOCIATION OF INDEPENDENT TOUR OPERATORS IATA

204 King Street, London W6 0RA


# සතර බ්‍රහ්ම විහරණ (සිව් බඹ විහරණ)

බඹ විහරණ යන වචනයෙන් උසස් විසීම යන අදහස කියැවෙයි. යම් කිසිවෙකු කරුණා, මෙත්තා, මුදිතා, උපෙක්ෂා යන උසස් ධර්ම සතර බොහෝ සෙයින් වඩමින්, දියුණු කරමින් වෙසෙනවා නම් එය උසස්වීමක් බැවින් එය බඹ විහරණ යයි බුදුරජාණන් වහන්සේ වදාළ සේක. ප්‍රමාණයක්, ගණනක් නොමැති වූ අපමණ සත්වයන් කෙරෙහි වැඩිය යුතු ධර්ම බැවින් **අප්‍රමාණ්‍ය ධර්ම** නාමයෙන්ද මෙය හැඳින් වෙයි. මේ උතුම් ගුණ සතර උදාර අදහස් තිබෙන උතුම් මිනිසුන් තුළ නිතොර පවතිනා බැවින් ඔව්හු මහත්මයන් වශයෙන් හැම කල්හිම සළකනු ලබති.

**මෙත්තා** - මෛත්‍රියයි. හිතවත් භාවයයි. යහපතක්ම වේවා කියා පැතීමයි. මෙලොව වෙසෙන මනුෂ්‍යයින් පමණක් නොව, සියළුම සත්වයින් කෙරෙහි මෛත්‍රී සිතුවිලි ඇතිකර ගැන්මයි. සිතේ දැවෙන ක්‍රෝධය, වෛරය, හිතෙන් පහකර ගැන්මයි. එවිට සිත මෛත්‍රිය වඩන්නට සුදුසු ලෙස සකස් වෙයි.

**කරුණා** - අනුන්ගේ දුකෙහි දී හදවත කම්පාවන ගතිය කරුණාවයි. මේ කරුණාව සත්පුරුෂයින්ගේ සිතේ පහළ වන්නක් මිස අසත්පුරුෂයින්ගේ සිතේ පහළ නොවෙයි. අනුන්ට වූ විපතක්, කරදරයක් තමන්ට වූ වූ දෙයක් ලෙස සලකා වහා පිහිටවීම කරුණාවන්ත තැනැත්තාගේ සිරිතයි. එය මනුෂ්‍යයින් කෙරේ පමණක් නොව සතුන් කෙරෙහිද පහළ වන දයාශීලී ගතියයි.

**මුදිතා** - පිටස්තර අයගේ දියුණුව දැකීමෙන් හෝ ඇසීමෙන් සන්තෝෂ වන්නාවූ ස්වභාවය මුදිතා නම් වෙයි. උසස් අදහස් තිබෙන සත්පුරුෂයෝ නිතරම අනුන්ගේ දියුණුව ප්‍රාර්ථනා කරන්නාහ. ඔව්හු අනුන්ගේ දියුණුව ද තමන්ගේ දියුණුව කොට සළකති. ඊර්ෂ්‍යාව මුදිතාවට පටහැනි ගතියයි. මුදිතාව වඩන අය ළඟ ඊර්ෂ්‍යාව බිඳකුදු නොමැත.

**උපේක්ෂා** - මැදහත්ව සිතීම සහ කටයුතු කිරීම උපේක්ෂාවයි. හරි වැරැද්දේ දී පැත්තක් නොගැනීම හා යුක්තිය හරිහැටි ඉෂ්ට කිරීම උපේක්ෂා සහගත පුද්ගලයාගේ සිරිතයි. අටලෝ දහම් අනුව දුක සැප ආවත්, ලාභ අලාභ වුවත්, ඒ කිසිවක දී ප්‍රීතිවීම හෝ ශෝකවීම නොකොට සියල්ල මැදහත් සිතින් ඉවසන්නෝ වෙත් නම් ඔව්හු උපේක්ෂා ගුණය පුරුදු කළ ඇත්තෝ වෙති.

♦ සුධර්මන් ගුණසේකර


ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

Transfer Fees From only £5

FAST CASH
SEND TODAY - COLLECT TODAY

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය



COMMERCIAL BANK
BOC BANK OF CEYLON
HNB
HSBC
සම්පත් බැංකුව SampathBank
PEOPLE'S BANK
Standard Chartered
Strong. Safe. Reliable. MCG Mike Cooke Group
දින 7ම විවෘතයි

www.efastcash.biz
020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT